**රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂණ ගාස්තු හා රේගු තොරතුරු සන්නිවේදන තාක්ෂණ අරමුදල - 2013**

ශ්‍රී ලංකා රේගුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂණ ගාස්තු හා රේගු තොරතුරු සන්නිවේදන තාක්ෂණ අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ ආදායම් හා වියදම් ප්‍රකාශනයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය ව්‍යාවනය**

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබූ අතර, අරමුදලේ ක්‍රියාකාරකම් දෙකක් වූ රේගු අතිකාල සඳහා වූ ආදායම් ප්‍රකාශනය උපචිත පදනම මත හා නැව් බඩු පරීක්ෂණ ගාස්තු හා රේගු තොරතුරු සන්නිවේදන තාක්ෂණ කොටසට අදාළ වූ ආදායම් ප්‍රකාශනය මුදල් පදනම මත පිළියෙල කර තිබුණි.

(ආ) රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂණ ගාස්තු හා රේගු තොරතුරු සන්නිවේදන තාක්ෂණ අරමුදල සඳහා ඒකාබද්ධ ආදායම් වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

ශ්‍රී ලංකා රේගුව විසින් නෞකා නියෝජිත ආයතන 91 ක් සමඟ එළඹ ඇති බැඳුම්කර ගිවිසුම්වලට අදාළව ලබාගෙන තිබුණු රු. 8,485,000 ක තැන්පතු, අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම වෙනුවට ශ්‍රී ලංකා රේගුවේ විශේෂ තැන්පතු ගිණුමේ තැන්පත් කර තිබුණි.

**2.2.3 ලැබිය යුතු ගිණුම්**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමස්ථ ණයගැතියන්ගෙන් සියයට 60 ක් නියෝජනය වූ රු. 20,877,676 ක ණයගැති ශේෂ වෙනුවෙන් සියයට 5 ක් බොල්ණය ප්‍රතිපාදනය කර තිබුණද අවුරුදු 10 කට වඩා වැඩි කාලයක සිට මෙම ණය ශේෂයන් අය නොවී පවතින බැවින්, එම අවිනිශ්චිතතාව සැළකිල්ලට ගෙන ප්‍රමාණවත් බොල්ණය ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි.

(ආ) ආයෝජන මණ්ඩලීය බහාළුම් පරීක්ෂණ අංගනය (BOI-CVT) ඔරුගොඩවත්ත නමින් 2004 වර්ෂයට අදාළව ණයගැතියන් තුළ ඇතුළත් රු.534,773 ක් වූ ශේෂය එම ආයතනයට අදාළ ජල බිල්පත් සඳහා 2008 වර්ෂයේදී හිලව් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදීද අරමුදලට ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2005 වර්ෂයට අදාළව අරමුදලට ලැබිය යුතු රු. 708,656 ක මුදලක් ඒකාබද්ධ අරමුදලින් දැරිය යුතු ජල හා විදුලි වියදම් වෙනුවෙන් 2008 වර්ෂයේදී හිලව් කිරීම නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**--------------------------------------**

වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන එකතුව රු.7,017,198 ක් වූ ජංගම වත්කම් සහ රු.1,730,375 ක් වූ ජංගම බැරකම් සඳහා සනාථ කිරීමේ ලිපිලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම**

**------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ------------------------------------ | ------------------ |
| (අ) | 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | නෞකා නියෝජිත ආයතන 91 ක් සමඟ එළඹ ඇති බැඳුම්කර ගිවිසුම්වලට අදාළව ලබාගෙන තිබුණු තැන්පතු සුදුසු ආයෝජන මාර්ගවල යොදවා රජයට හා තැන්පතු හිමියන්ට ගෙවිය යුතු ආදායම් හඳුනාගැනීම හා ගිණුම්ගත කිරීම සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2013 සැප්තැම්බර් 27 දිනැති අංක 1829/39 දරන මුදල් අමාත්‍යවරයාගේ අතිවිශේෂ ගැසට් පත්‍රය | අරමුදලේ නම " රේගු අතිකාල, නැව්බඩු පරීක්ෂණ හා රේගු තොරතුරු සන්නිවේදන තාක්ෂණ අරමුදල" ලෙස වෙනස් කර තිබුණද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබුණේ "රේගු අතිකාල හා නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදල" ලෙසය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අතිකාල අරමුදලට අදාළ මූල්‍ය ප්‍රතිඵල පමණක් ආදායම් වියදම් ගිණුමේ දක්වා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් රු.20,318,093 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.145,587,707 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.165,905,800 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අතිකාල වියදම සියයට 47 කින් වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 09 කට අදාළ අතිකාල අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| වර්ෂය | ආදායම | වියදම | අතිරික්තය / (ඌනතාව) | ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය / (පිරිහීම) ප්‍රතිශතයක් ලෙස | අතිරික්තය (ඌනතාවය) ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | | |
| 2004 | 336.786 | 302.717 | 34.069 | (40.15) | 10.12 |
| 2005 | 381.696 | 367.750 | 13.946 | (59.06) | 3.65 |
| 2006 | 490.012 | 384.789 | 105.223 | 654.52 | 21.47 |
| 2007 | 576.415 | 425.920 | 150.495 | 43.02 | 26.11 |
| 2008 | 576.671 | 424.275 | 152.396 | 1.26 | 26.43 |
| 2009 | 465.837 | 410.236 | 55.602 | (64) | 12.00 |
| 2010 | 583.491 | 416.289 | 167.202 | 200 | 28.64 |
| 2011 | 593.065 | 421.883 | 171.182 | 2.38 | 28.86 |
| 2012 | 577.392 | 431.805 | 145.587 | (14.95) | 25.21 |
| 2013 | 588.163 | 608.481 | (20.318) | (113.95) | (3.46) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අරමුදලින් කාර්ය මණ්ඩලය වෙත දරා ඇති වියදම රු.549,708,309 ක් වූ අතර, ඉකුත් වර්ෂයේදී එය රු. 373,430,297 ක් විය. 2013 මාර්තු 01 දිනැති ශ්‍රී ලංකා රේගුවේ අභ්‍යන්තර චක්‍රලේඛ අංක 855 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී සියලුම නිලධාරීන්

සඳහා ගෙවන අතිකාල මුදල සියයට 45 කින් වැඩිකර ගෙවීම පසුගිය වර්ෂයට වඩා අතිකාල වියදම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා රේගුවේ සමස්ථ කාර්ය මණ්ඩලය 2078 ක් වූ අතර අරමුදලේ වාර්ෂික ඒක සේවක සාමාන්‍ය අතිකාල පිරිවැය රු.264,537 ක් විය. ඉකුත් වර්ෂයේදී ඒක සේවක සාමාන්‍ය අතිකාල පිරිවැය රු.174,093 ක් විය. ඒක සේවක සාමාන්‍ය අතිකාල පිරිවැය ගණන් බැලීමේදී ශ්‍රී ලංකා රේගුවේ වැය ශීර්ෂය යටතේ ඒකාබද්ධ අරමුදලින් දරණ ලද අතිකාල වියදම් ඇතුළත් කර නොමැත. 2013 වර්ෂය සඳහා දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ දරන ලද පිරිවැය රු.3,482,065 කි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ පරිහරණය නොකළ මුදල් භාණ්ඩාගාර තැන්පතු ලෙස වර්ෂයෙන් වර්ෂය ඉදිරියට ගෙනවිත් තිබුණු අතර, එම තැන්පතු ගිණුමේ ශේෂය සහ අරමුදල් ශේෂයන් පහත දැක්වෙන පරිදි වර්ධනය වීමක් පෙන්නුම් කෙරිණි. එම මුදල් පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර සුදුසු ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි.

| වර්ෂය | අතිකාල අරමුදලේ ශේෂය | නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලේ ශේෂය | භාණ්ඩාගාර තැන්පතු ගිණුමේ ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2005 | 28,007,949 | - | 28,007,949 |
| 2006 | 254,940,825 | 93,672,857 | 348,613,682 |
| 2007 | 451,423,786 | 157,259,952 | 608,683,738 |
| 2008 | 616,810,938 | 246,576,326 | 863,387,264 |
| 2009 | 669,350,013 | 322,004,787 | 991,354,800 |
| 2010 | 849,082,264 | 369,645,856 | 1,218,728,121 |
| 2011 | 1,022,822,795 | 252,069,822 | 1,274,892,617 |
| 2012 | 1,176,009,046 | 290,987,052 | 1,466,999,098 |
| 2013 | 1,172,194,952 | 326,530,883 | 1,498,725,835 |

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට රු. 34,670,140 ක් වූ විවිධ ණයගැති ශේෂය තුළ ආයතන 13 කට අදාළ එකතුව රු. 2,350,079 ක් වූ ණයගැති ශේෂ වර්ෂ ගණනාවක සිට පැවති අතර එම ආයතනවලට අදාලව විශේෂ තැන්පතු ලෙස රු.3,100,273 ක වගකීමක්ද ශේෂ පත්‍රයේ පැවතිණි. එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) අපනයන අංශයේ බහාළුම් පරීක්ෂාව සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවට අනුව නිලධාරීන් තිදෙනෙකු විසින් එක් දිනකදී පරීක්ෂණ අවස්ථා 35 - 45 ත් අතර සංඛ්‍යාවක් කාර්යාල වේලාවෙන් පසුව සිදු කිරීම හා එය එකම වෙලාවක ස්ථාන දෙකක හෝ වැඩි සංඛ්‍යාවක සිදු කර තිබීමත්, ඉතා කෙටිකාලයක් තුළ විවිධ දිශාවන්වල පිහිටි ආයතනවලට ගොස් පරීක්ෂාවන් සිදු කර තිබීමත් ප්‍රායෝගිකව පිළිගත නොහැකි තත්ත්වයක් නිසා එම නිලධාරීන් සඳහා නැව් බඩු පරීක්ෂණ ගාස්තු වශයෙන් ගෙවා තිබුණු රු. 129,200 ක ගෙවීම් සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතාවය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රන්ක් බහාළුම් මෙහෙයුම් අංගනයට (RCT) අදාළව නියැදි පරීක්ෂාවකට ලක් කරන ලද 2013 සැප්තැම්බර් 01 සිට සැප්තැම්බර් 10 දක්වා කාලය තුළ, අනුයුක්ත කරන ලද නිලධාරීන් අතරින් සියයට 50 කට වැඩි සංඛ්‍යාවක් සේවයට වාර්තා කර නොමැති බවත්, පැමිණීම සටහන් කළ සමහර නිලධාරීන් පරීක්ෂණ කටයුතු වලට සහභාගී වූ බවට ලිඛිත සාක්ෂි මගින් සනාථ නොවුණි.

(ආ) 1967 සිට 1973 දක්වා කාලපරිච්ඡේදය තුළ ආයතන 75 කින් ලබා ගෙන ඇති රු.263,500 ක් වූ මූලික තැන්පතු මුදල්, ඉතිරි කිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලබාගෙන ඇති පොළිය රු.10,866,028 ක් විය. වර්ෂ ගණනාවක සිට මෙම මුදල් ඉතිරි කිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීම හේතුවෙන් ඉතා අඩු පොළී ආදායමක් උපයා තිබුණු අතර, අදාල මුදල් වෙනත් සුදුසු ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පසුගිය වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව විගණන වාර්තා මඟින් පෙන්වා දී තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ අතිකාල සමාලෝචන කමිටුවේ නිර්දේශය මත නිලධාරීන්ගේ අතිකාල දීමනාව සියයට 45 කින් වැඩි කර ගෙවා ඇති අතර ඒ සඳහා ලබාගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාස 02 ක කාල පරිච්ඡේදය තුළ අපනයන අංශයේ නිලධාරීන් 06 දෙනෙකු සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන පරීක්ෂාවේදී එක් මාසයක් සඳහා සෑම නිලධාරියෙකුම පැය 395 සිට පැය 663 ක් දක්වා වූ පරාසයක් තුළ අතිකාල සේවයේ යෙදී තිබුණි. පෙබරවාරි මාසය තුළ පමණක් අතිකාල වැටුප් ලෙස රු.25,841 සිට 44,311 ක් දක්වා පරාසයක් තුළ නිලධාරීන්ට ගෙවා තිබුණි. මෙම නිලධාරීන් අතරින් නිලධාරීන් 05 දෙනෙකුම මාසයේ සෑම දිනකම පැය 20 ඉක්මවා අතිකාල සේවයේ යෙදී තිබුණි.

(ඇ) නියැදි විගණන පරීක්ෂාව සිදු කළ කාලපරිච්ඡේදය තුළ එක් නිලධාරියෙකුට රු.26,574 සිට රු. 36,292 දක්වා වූ පරාසයක් තුළ මාසික අතිකාල දීමනාවට අමතරව එම මාසය සඳහාම රු.129,860 සිට රු. 165,100 ක් දක්වා වූ පරාසයක් තුළ නැව්බඩු පරීක්ෂණ ගාස්තුද ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 53 ක ප්‍රමාණාත්මක ඉහළ යාමක් අනාවරණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බැව් නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

**---------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) හිඟ ආදායම්
(ආ) අතිකාල සේවය
(ඇ) ගිණුම්කරණය
(ඇ) බහාලුම් පරීක්ෂණ කටයුතු